විභාග අංකය :

………………………………

# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

## දීප ව්‍යාප්ත භාෂා පුහුණු වැඩසටහන

## අවසාන විභාගය 2008

**සිංහල භාෂාව II මට්ටම (නවනිර්දේශය)**

**ප්‍රශ්න පත්‍ර අංක 2**

**2008.09.27**

**කාලය පැ තුනයි.**

**ලකුණු 30යි.**

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි. | |
|---|---|
| ප්‍ර.අංක | ලකුණු |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |
| 11. | |
| 12. | |
| 13. | |
| එකතුව 100% | |
| 30% | |

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**

1. පහත සඳහන් නාම වචනවල බහු වචන දක්වන්න.

(i) පාර්ලිමේන්තුව ………………………………….

(ii) කාරක සභාව ………………………………….

(iii) අයවැය ලේඛනය ………………………………….

(iv) අධ්‍යක්ෂවරයා ………………………………….

(v) ප්‍රතිලාභය ………………………………….

(vi) ගිණුම ………………………………….

(vii) විමසීම් කවුළුව ………………………………….

(viii) කළමනාකාර සහායකයා ………………………………….

(ix) කොමසාරිස්වරයා ………………………………….

(x) පිළිගැනීමේ නිලධාරියා ………………………………….

2. පහත සඳහන් නාමවචනවල ඒක වචන දක්වන්න.

(i) ප්‍රචාරණ නිලධාරීහු ………………………………..

(ii) ආරක්ෂකයෝ ………………………………..

(iii) ලිපි ගොනු ………………………………..

(iv) වෛද්‍යවරු ………………………………..

(v) විශේෂඥයෝ ………………………………..

(vi) පරීක්ෂකවරු ……………………………….

(vii) වෙන්දේසිකරුවෝ ……………………………….

(viii) විදුලි කාර්මිකයෝ ……………………………….

(ix) සම්මන්ත්‍රණ ……………………………….

(x) කාර්ය මණ්ඩල ……………………………….

3. පහත සඳහන් වාක්‍යවල ඇති විශේෂණ පද සලකුණු කරන්න.

උදා : <u>පළපුරුදු</u> කම්කරුවන් අවශ්‍ය ය.

(i) ප්‍රධාන කාර්යාලය අගනුවර පිහිටා ඇත.

(ii) මේ ප්‍රදේශ අධික ජනගහණයෙන් යුක්තය.

(iii) සියලු ඉංජිනේරුවෝ සමුළුවට සහභාගී වූහ.

(iv) දක්ෂ ලිපිකරුවෝ I ශ්‍රේණියට උසස් කරනු ලැබූහ.

(v) පාර්ලිමේන්තුවේ නව සැසිවාරය ආරම්භ වන්නේ අදය.

4. පහත සඳහන් වාක්‍යවල ඇති අතීත කාල ක්‍රියා වර්තමාන කාලයට හරවන්න.

(i) පාලක මණ්ඩලය අතුරු ව්‍යවස්ථාව සලකා බැලුවේය.

……………………………………………………………………………………..

(ii) පාර්ලිමේන්තුව, අයබදු පනත සම්මත කළේය.

……………………………………………………………………………………..

(iii) දෙපාර්තමේන්තු ප්‍රධානියා සේවකයන් ඇමතුවේය.

……………………………………………………………………………………..

(iv) සෞඛ්‍ය පරීක්ෂකයෝ පලිබෝධකයන් පාලනය කිරීමට අනුමත ඖෂධ සංයෝග භාවිතා කළහ.

……………………………………………………………………………………..

(v) ඔවුහු සම්මන්ත්‍රණයට සහභාගී වූහ.

……………………………………………………………………………………..

5. පහත සඳහන් වාක්‍යයේ ඇති සියලු නිපාත සලකුණු කරන්න. වාක්‍යයේ පළමු නිපාතය සලකුණු කොට ඇත.

කිසිම තැනැත්තෙකු <u>විසින්</u>, ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරයක් හෝ දේශීය ජලතීරයෙන් යම් කොටසක් හෝ අපවිත්‍රවීම, අහිතකරවීම, විෂවීම,අපිරිසිදුවීම, මනුෂ්‍ය වර්ගයාගේ සෞඛ්‍යට, සුභ සාධනයට, ආරක්ෂාවට හෝ දේපළට හානි කර වීම, සත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, මත්ස්‍යයන්ට, ශාකවලට හෝ වෙනත් ආකාරයේ ජීවීන්ට විෂ සහිත වීම හෝ හානිදායක වීම, නැතහොත් ඒ ජලතීරය වැඩදායී ලෙස උපයෝගී කිරීමෙහි ලා හානිකරවීම සිදුවන පරිදි හෝ එසේ සිදු වෙතැයි සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි පරිදි ඒ ජලතීරයේ භෞතික රසායනික හෝ ජෛවී තත්ත්වය වෙනස් වන ආකාරයෙන් ඒ ඒ දේශීය ජලතීරය දූෂණය කිරීම හෝ දූෂණය කිරීමට සැලැස්වීම හෝ එසේ දූෂණය කිරීම සැලැස්වීමෙහි ලා අවසර දීම නොකළ යුතු ය.

6. පහත සඳහන් වාක්‍ය **<u>නැත</u>** යන අර්ථ ඇති වාක්‍ය බවට පත් කරන්න.

(i) අධ්‍යක්ෂවරයා ඊයේ සේවකයන් ඇමතුවේ ය.

.............................................................................................

(ii) ප්‍රාදේශීය සභාව අද රැස්වෙයි.

.............................................................................................

(iii) අග්‍රාමාත්‍යවරයා නව ගොඩනැගිල්ල විවෘත කළේය.

.............................................................................................

(iv) ගුරුවරු උත්තරපත්තර ඇගයීමට එකඟ වූහ.

.............................................................................................

(v) පරිසර අමාත්‍යාංශය තම කාර්යය කාර්යක්ෂමව ඉටු කරයි.

.............................................................................................

7. පහත සඳහන් වාක්‍ය ලිඛිත සිංහලයට පෙරළන්න.

(i) සභාපතිතුමා රැස්වීම විසුරුවා හැරියා.

.............................................................................................

(ii) ඇමති මණ්ඩලය අද උදේ රැස් වෙනවා.

.............................................................................................

(iii) අභිනව ගොඩනැගිල්ල විවෘත කළා.

.............................................................................................

(iv) විත්තිකරුවා වරද පිළිගත්තා.

.............................................................................................

(v) මේ මෝටර් රථය රක්ෂණය කරලා නෑ.

.............................................................................................

8. පහත සඳහන් වාක්‍ය වැරදි නම් නිවැරදි කරන්න.

(i) ඡන්දදායකයන් උදෙන්ම ඡන්දපළට පැමිණියහ.

.............................................................................................

(ii) අභිනව මන්ත්‍රීවරයා සභාගැබට පිවිසෙති.

.............................................................................................

(iii) ආධුනිකයෝ උදැසනම පිවිසෙයි.

.............................................................................................

(iv) සියල්ලෝ සම්මුතියකට පැමිණියහ.

.............................................................................................

(v) මන්ත්‍රීවරිය සභාව ඇමතුවේය.

.............................................................................................

9. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) විනිසුරුතුමා විත්තිකරු නිදහස් කළේය.

……………………………………………………………………………………..

(ii) අමාත්‍යවරයා ව්‍යවස්ථාපිත මණ්ඩලය පත් කළේය.

……………………………………………………………………………………..

(iii) ගණකාධිකාරීතුමා ගිණුම් වාර්තාව සකස් කරයි.

……………………………………………………………………………………..

(iv) අපද්‍රව්‍ය පරිසරය දූෂණය කරයි.

……………………………………………………………………………………..

(v) කාර්මිකයෝ දින හැටකින් ගුවන් පාලම ඉදි කළහ.

……………………………………………………………………………………..

10. පහත සඳහන් වාක්‍ය දෙමළ භාෂාවට පරිවර්තනය කරන්න.

(i) එම කාර්යාලය අලුතින් ආරම්භ කරන ලදී.

……………………………………………………………………………………..

(ii) ඔබ දුම්රිය පළට උදැසනින් ම පැමිණිය යුතුය.

……………………………………………………………………………………..

(iii) ගුරුවරු වැටුප් සංශෝධනයක් ඉල්ලා සිටිති.

……………………………………………………………………………………..

(iv) ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ආධාර අවශ්‍ය ය.

……………………………………………………………………………………..

(v) විදේශ ගතවීමට ගමන් බලපත්‍රයක් ලබාගත යුතුය.

……………………………………………………………………………………..

(vi) දේශීය නිෂ්පාදන අපනයනයෙන් විදේශ විනිමය ලැබේ.

……………………………………………………………………………………..

(vii) ඔවුහු උසස් අධ්‍යාපනය සඳහා විදේශ ගත වූහ.

……………………………………………………………………………………..

(viii) කථානායකවරයා මන්ත්‍රීවරුන්ගේ හැසිරීම අනුමත නොකළේය.

……………………………………………………………………………………..

(ix) ජනාධිපතිවරයා ජාත්‍යන්තර කීර්තියට පත් වූවෙකි.

……………………………………………………………………………………..

(x) සාම සාකච්ඡා පැවැත්වීම වැඩදායක අන්දමින් සිදුවිය යුතු වෙයි.

……………………………………………………………………………………..

11. පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.

(i) පාසැල් පොත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සපයනු ලැබේ.

……………………………………………………………………………………..

(ii) සිරකරුවෝ අධිකරණය විසින් නිදහස් කරනු ලැබූහ.

……………………………………………………………………………………..

(iii) රක්ෂණ ඔප්පු හිමියා විසින් මුද්දර ගාස්තු ගෙවනු ලැබේ.

……………………………………………………………………………………..

(iv) ඔවුන්ගේ ආරවුල් සමථ මණ්ඩලය විසින් විසඳන ලදී.

……………………………………………………………………………………..

(v) ළමා ආරක්ෂක අධිකාරිය විසින්, ළමා අපචාර වැළැක් වේ.

……………………………………………………………………………………..

12. පහත සඳහන් දෙමළ වාක්‍ය හෝ ඉංග්‍රීසි වාක්‍ය සිංහලයට හරවන්න.

(i) நீங்கள் எல்லோரும் பாடுங்கள்.

……………………………………………………………………………………..

(ii) அந்த மரத்தில் ஏற வேண்டாம்

……………………………………………………………………………………..

(iii) நான் கீரிமலைக்குப் போக வேண்டும்

……………………………………………………………………………………..

(iv) நானும் உங்களுடன் வருகின்றேன்

……………………………………………………………………………………..

(v) என்னால் நடக்க முடியவில்லை

……………………………………………………………………………………..

(vi) இன்று கண்டியில் நல்ல மழை.

……………………………………………………………………………………..

(vii) உங்களுக்குச் சுகமிலலையென்று எனக்குத்தெரியாது

……………………………………………………………………………………..

(viii) என்னோடு நீங்களும் வாருங்கள்

……………………………………………………………………………………..

(ix) எனக்குப் பதவி உயர்வு வேண்டும்

……………………………………………………………………………………..

(x) எனது தந்தையார் இறந்து விட்டார்

……………………………………………………………………………………..

(i) Many citizens seek the help of government hospitals.

……………………………………………………………………..…………………..

(ii) School text books have been dispatched to Jaffna

……………………………………………………………………..…………………..

(iii) The plan is to modernize the oil refinery.

……………………………………………………………………..…………………..

(iv) A cabinet minister addressed the gathering.

……………………………………………………………………..…………………..

(v) Majority of youths in rural areas suffer from dental problems.

……………………………………………………………………..…………………..

(vi) A Sri Lankan woman writer has won a prestigious award.

……………………………………………………………………..…………………..

(vii) Alternative solutions should be provided to over come the energy crisis.

……………………………………………………………………..…………………..

(viii) The gas prices in the world market are frequently fluctuating.

……………………………………………………………………..…………………..

(ix) The Sri Lankan government has decided to construct seven flyovers this year.

……………………………………………………………………..…………………..

(x) His appointment has been terminated without any prior notice.

……………………………………………………………………..…………………..

13. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

15 වන සාර්ක් රාජ්‍ය නායක සමුළුව ඉතා උත්කර්ෂවත් ලෙස ශ්‍රී ලංකාවේදී මුළු දුන් බව අපි කවුරුත් දනිමු. සාර්ක් සමුළුවට පෙර සිට මේ සමුළුව අපේ රටේ පැවැත්වීම පිළිබඳව නොයෙකුත් විවේචන එල්ල වු බවද රහසක් නොවේ. මාලදිවයිනේ පැවැත්වීමට නියමිතව තිබූ මේ සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම නිසා ජීවන බරින් මිරිකී ජීවත්වන ජනයා මත තව තවත් බර පටවන්නක් වනු ඇති බවටද චෝදනා එල්ල විය. කවරක් නමුත් මේ සමුළුව පිළිබඳව අප ආර්ථිකමය ඇසකින් බැලීමද ඉතා වැදගත්ය. සාර්ක් සමුළුව අප රටේ පැවැත්වීම නිසා අප රටට අත්වන වාසි පිළිබඳව මේ ලිපියෙන් අපගේ අවධානය යොමු වෙයි.

මෙවර සාර්ක් සමුළුවේදී සිදුවූ ප්‍රධානතම කරුණු කිහිපයකි. ඒවා නම් සාර්ක් සංවර්ධන අරමුදලක් පිහිටුවීමේ ගිවිසුමට අත්සන් තැබීම, දකුණු ආසියානු කලාපීය තත්ත්ව පාලන ආයතනයක් පිහිටුවීමේ ගිවිසුමට අත්සන් තැබීම, අපරාධ මර්දනය කිරීමේ අන්‍යෝන්‍ය සහයෝගිතා ගිවිසුමකට අත්සන් තැබීම, දකුණු ආසියානු සහයෝගිතා ගිවිසුමට ඇෆ්ගනිස්ථානය එක්කර ගැනීම, සාර්ක් ආහාර බැංකුවක් පිහිටුවීමට ඇතිකරගත් එකඟතාව, ත්‍රස්තවාදය මරද්නය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය වහාම ක්‍රියාවට නැඟීම සඳහා ඇති කර ගත් එකඟතාව, සාර්ක් විශ්වවිද්‍යාලය සහ සාර්ක් කලාපය තුළ පොදු මුදල් ඒකකයක් ඇති කර ගැනීම සඳහා ඇති කරගත් එකඟතාව යන කරුණුය. මෙවර සාර්ක් සමුළුවේදී සිදුවූ සමස්තය දෙස බැලීමේදී අප මේ සඳහන් කළ කරුණු ප්‍රධානතම සහ සුවිශේෂි වැදගත්කමකින් යුතු ඒවාය. මෙවර සමුළුව අප රටේ පැවැත්වීමෙන් අප රටට ලැබෙන

වාසිවලට අමතරව පොදුවේ සියලුම සාමාජික රටවලට ඉහත සඳහන් කළ සිදුවීම්වල ප්‍රතිලාභ අපේක්ෂා කරන පරිදි ලබා ගැනීම සඳහා මේවායේ ක්‍රියාත්මක වීමේ ප්‍රගතියද ඉතා වැදගත්ය. මේ සියල්ල යථාර්ථයක් බවට පත් කර ගැනීමේදී සියලු රටවල කැපවීම වැදගත්ය.

මෙම සමුළුවේදී කතා කළ ඉන්දීය අග්‍රාමාත්‍ය ආචාර්ය මන්මෝහන් සිං මහතා සුවිශේෂී ප්‍රකාශයක් කළේය. එනම් ලෝක ආර්ථික වර්ධනයේ එන්ජිම ආසියාව බවත්, දකුණු ආසියාව එහි කොටසක් (පාර්ශ්වකරුවකු) වන බවයි. සාර්ක් කලාපයේ ආර්ථික වැදගත්කම මේ ප්‍රකාශයෙන් අපට හොඳටම පැහැදිලිය. ලෝක ජනගහනයෙන් හතරෙන් එකක් පමණ වන වැඩිම ජන නියෝජනය ඇත්තේ මේ කලාපයේය. සමුළුව හරහා කලාපීය සහයෝගය රටවල් අතර ක්‍රියාත්මකවීමේදී තිබෙන ඉතා සුවිශේෂී ආර්ථික වැදගත්කමක් වන්නේ නිදහස් වෙළඳ ගිවිසුම් තුළින් වෙළඳ කටයුතු වැඩිදියුණු කර ගැනීමට සියලුම සාමාජික රටවලට මහඟු අවස්ථාවක් උදා කරගත හැකිවීමය.
සාර්ක් සංවර්ධන අරමුදලේ ප්‍රධානතම අරමුණ වන්නේ සියලුම සාර්ක් සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා ප්‍රධානතම මූල්‍ය ආයතනය ලෙස කටයුතු කිරීමයි. මෙම අරමුදලේ අපේක්ෂිත ඉලක්කය ඇමරිකානු ඩොලර් දශලක්ෂ 300 කි. සියලුම සාර්ක් රටවල සංවර්ධනය වෙනුවෙන් මේ අරමුදලෙන් පුළුල් මෙහෙවරක් සිදු කළ හැකි වනු ඇත.

(i) සාර්ක් සමුළුව පැවැත්වීමට නියමිතව තිබුණේ කවර රටක ද?

……………………………………………………………………………………..

(ii) සාර්ක් සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට ඇතැමුන් විරුද්ධ වුයේ ඇයි?

……………………………………………………………………………………..

(iii) සාර්ක් සමුළුවේදී සිදු වූ ප්‍රධාන කරුණු මොනවාද ?

……………………………………………………………………………………..

(iv) සාර්ක් සමුළුවෙන් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලැබෙන බවක් මෙයින් කියැවේද?

……………………………………………………………………………………..

(v) මෙම සමුළුවේදී ඉන්දීය අග්‍රාමාත්‍යවරයා කළ සුවිශේෂී ප්‍රකාශය කුමක් ද?

……………………………………………………………………………………..

(vi) මෙහි සඳහන් නිදහස් වෙළඳ ගිවිසුමින් ඇතිවන ප්‍රතිලාභ කවරේ ද?

……………………………………………………………………………………..

(vii) සාර්ක් සංවර්ධන අරමුදලේ පරමාර්ථය කුමක් ද?

……………………………………………………………………………………..

(viii) සාර්ක් අරමුදලේ අපේක්ෂිත ඉලක්කය කුමක් ද?

……………………………………………………………………………………..

(ix) ඇෆ්ගනිස්ථානය සාර්ක් සමුළුවේ සාමාජිකත්වය ලබා ගත්තේ කවර කලක ද?

……………………………………………………………………………………..

(x) සාර්ක් සමුළුවේ පරමාර්ථ ඉෂ්ට කරගැනීම පිණිස ඉතා අවශ්‍ය වන්නේ කුමක් ද?

……………………………………………………………………………………..